# කාර්ය සාධන වාර්තාව
# செயலாற்றுகை அறிக்கை
# PERFORMANCE REPORT

# 2017

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

**இறக்குமதி ஏற்றுமதி கட்டுப்பாட்டுத் திணைக்களம்**

**Department of Imports and Exports**

# කාර්ය සාධන වාර්තාව

# 2017

**ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව**

# පටුන

**පිටුඅංකය**

| | |
|---|---|
| හැඳින්වීම | 01 |
| දැක්ම | 02 |
| මෙහෙවර | 02 |
| කාර්යයන් | 02 |
| නිමැවුම | 03 |
| කාර්ය මණ්ඩලය | 03 |
| තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය | 05 |
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය | 05 |
| 2017 වර්ෂය තුළ ප්‍රකාශයට පත් කළ රෙගුලාසි | 11 |
| ආදායම - 2017 | 16 |
| වියදම් විශ්ලේෂණය - 2017 | 16 |
| මූල්‍ය ප්‍රභවයන් | 17 |
| ආදායම් හා වියදම් විශ්ලේෂණය | 18 |
| පසුගිය වසර 5 තුළ බලපත්‍ර සංඛ්‍යාව සහ ඉපැයූ ආදායම | 18 |
| පසුගියවසර 5 තුළ ආදායම සහ බලපත්‍ර පිළිබඳ දත්ත සමාලෝචනය | 20 |
| ඇමුණුම 01 - සංවිධාන සටහන | |

# ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

1969 අංක 1 දරන පනතින් පිහිට වූ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මේ වර්ෂය වන විට පුරා වසර 48 ක් තම මෙහෙවර ජාතිය වෙනුවෙන් ඉටුකර ඇත. ආනයන හා අපනයන පාලනය කිරීමේ අරමුණ පෙරදැරිව මෙම දෙපාර්තමේන්තුව ආරම්භ කළද වර්තමානය වන විට ඊට අදාළ ප්‍රතිපත්ති සම්පාදකයෙකුගේ කාර්යය ද ඉටුකරනු ලබයි.

ඒ අනුව ජාත්‍යන්තර වෙළඳාමට අදාළ ආනයන අපනයන රෙගුලාසි පිළියෙල කිරීමද, ආනයන අපනයන සඳහා පහසුකම් සැපයීම හා ප්‍රවර්ධන කටයුතු ඉටු කිරීමද දක්වා අදාළ කාර්යභාරය පුළුල් වී ඇත. ඒ අනුව, ජාතික ආරක්ෂාවට අදාල කටයුතු ඉටු කිරීම ද මහජන සුභසිද්ධිය, පරිසරය හා මහජන සෞඛ්‍ය සුරක්ෂිතතාව ආරක්ෂා කිරීම ද යන මූලික අභිමතාර්ථ පෙරදැරිව අදාළ කටයුතු ඉටු කරනු ලැබේ.

තවද, ජාත්‍යන්තර වෙළඳාම තුළ ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සුරක්ෂිත වන පරිදි අපනයන භාණ්ඩ සඳහා ප්‍රමිතිකරණයක් හඳුන්වාදීම ද මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අතරට වැටේ. ඊට අමතරව විනිමය පාලන දෙපාර්තමේන්තුව සමග එක් වී විනිමය පාලන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රායෝගික පියවර ගැනීම ද නව ප්‍රවණතාවයකි.

ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරන ලද බාසල්, ස්ටොක්හෝම් සහ රොටර්ඩෑම් වැනි ජාත්‍යන්තර සම්මුතීන්ට අනුගතව ආනයන හා අපනයන නියාමනය සඳහා පියවර ගෙන ඇත. උදාහරණ ලෙස පසුගිය වසර තුළ සාම්ප්‍රදායික පේනු සහ කෙවෙනි ආනයනය තහනම් කිරීමටත්, ඒ සඳහා නව ප්‍රමිතියක් යටතේ ඇම්පියර් 13 සහිත පේනු සහ කෙවෙනි ආනයනය සඳහා නීති සකස් කරන ලදි.

සෑම වසර හතරකටම වතාවක් ලෝක රේගු සංවිධානය සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සංශෝධනය කරනු ලබන අතර 2017 වර්ෂයේ මුදල් අමාත්‍යාංශය විසින් ආදායම් ආරක්ෂණ නියෝග සඳහා කරන ලද සංශෝධනයට අනුව ආනයන හා අපනයන පාලනයට යටත් භාණ්ඩ ලැයිස්තුව ද මෙම දෙපාර්තමේන්තුව විසින් සංශෝධනයකර ප්‍රකාශයට පත් කරන ලදි.

මෙම දෙපාර්තමේන්තුවේ සේවා දායකයින් සඳහා වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් සැපයීම අරමුණු කර ගනිමින් සකස් කරන ලද නව පරිඝනක පද්ධතිය භාවිතයෙන් බලපත්‍ර ලබා ගැනීම, අන්තර්ජාලය හරහා අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පහසුකම් සළසා දී ඇත. නුදුරු අනාගතයේදී එළෙස යොමු කරනු ලබන අයදුම්පත් සඳහා බලපත්‍ර නිකුත් කිරීම පූර්ණ වශයෙන්ම අන්තර්ජාලය හරහා සිදුකිරීමට පහසුකම් සපයනු ඇත.

## දැක්ම

යහපත් අනාගතයක් උදෙසා පරිසරය
මහජනතාව සුරක්ෂිත කිරීම

## මෙහෙවර

රටේ ආරක්ෂාව,ආර්ථිකය,මහජන සෞඛ්‍යය,පරිසර සංරක්ෂණය ආදිය සැලකිල්ලට ගෙන භාණ්ඩ ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජය විසින් වරින් වර ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ 1969 අංක 1 දරන ආනයන හා අපනයන පාලන පනත අනුව ක්‍රියාත්මක කිරීම.

## කාර්යයන්

- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය රෙගුලාසි ප්‍රසිද්ධ කිරීම.
- ආනයන හා අපනයන බලපත්‍ර නිකුත් කිරීම මගින් ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසි සම්බන්ධ කරුණුවලදී රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හා වාණිජ බැංකු වලට සහාය වීම.
- ආනයන පාලන රෙගුලාසි සම්බන්ධ මෙහෙයුම් උපදෙස් වාණිජ බැංකුවලට නිකුත් කිරීම.

## නිමැවුම

- 2017 වර්ෂය තුළදී ආනයන හා අපනයන බලපත්‍ර 14,887 ක ප්‍රමාණයක් පමණක් නිකුත් කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වූ ආනයනයන් හා අපනයනයන් පාලනය කිරීම.
- ආනයන බලපත්‍රයට අනුකූලව භාණ්ඩ ආනයනය කළේ ද යන්න තහවුරු කිරීම් ලබා ගැනීමෙන් පසු හර කිරීම් මගින් ආනයන පාලනය විධිමත් කිරීම.
- ආනයන හා අපනයන පාලන ප්‍රතිපත්ති මත විදේශ විනිමය වැය නොවන පදනම මත සිදු කරනු ලබන ආනයනයන් සඳහා අවසර ලබා දීම.
- ආනයන හා අපනයන පාලන රෙගුලාසිවලට අනුකූල නොවන අවස්ථා සම්බන්ධයෙන් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ විනිමය පාලක වෙත අවශ්‍ය සහායන් ලබා දීම.
- ආනයන හා අපනයන පාලනය සම්බන්ධයෙන් වාණිජ බැංකුවලට මෙහෙයුම් උපදේශන නිකුත් කිරීම.
- බලපත්‍ර නිකුත් කිරීමෙන් ලද ගාස්තු වශයෙන් රුපියල් මිලියන 1,487 ක ආදායමක් එක්රැස් කර රජයේ ඒකාබද්ධ අරමුදලට බැරකිරීම.

## කාර්ය මණ්ඩලය

ආනයන හා අපනයන පාලන බලපත්‍ර නිකුත් කිරීම, හර කිරීම හා ආදායම් එක්රැස් කිරීමේ කාර්යයන් මෙන්ම සාමාන්‍ය කාර්යාල පරිපාලන කටයුතු සහ ප්‍රතිපත්ති හා සැලසුම් කාර්යයන් සඳහා පහත කාර්ය මණ්ඩලය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යොදවන ලදී. (වගුවඅංක 01)

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ සේවාවන් ඉහළම කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙන යාමටත්,සේවාදායකයින්ට ඵලදායී කාර්යක්ෂම හා මිත්‍රශීලී සේවාවක් සැපයීමටත් මෙම කාර්ය මණ්ඩලය වර්ෂය මුළුල්ලේම වගකීමෙන් යුතුව සාමූහිකව ක්‍රියාකරන ලදී.

### ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

**(වගුව අංක 1)**

| අනු අංකය | තනතුර | වැටුප් ක්රමය | සේවය | අනුමත තනතුරු සංඛ්යාව | **2017.12. 31** දිනට සිටින සංඛ්යාව | පුරප්පාඩු සංඛ්යාව |
|---|---|---|---|---|---|---|
| 1 | ආනයන හා අපනයන පාලක ජනරාල් | SL3 - 2016 A | ශ්‍රී.ලං.ප.සේ - විශේෂ | 1 | 01 (වැ.බ.) | 1 |
| 2 | ආනයන හා අපනයන පාලක | SL1 - 2016 A | ශ්‍රී.ලං.ප.සේ - I | 2 | 2 | 0 |
| 3 | සහකාර/නියෝජ්‍ය පාලක | SL1 - 2016 A | ශ්‍රී.ලං.ප.සේ - II/III | 6 | 3 | 3 |
| 4 | ගණකාධිකාරි | SL1 - 2016 A | ශ්‍රී.ලං.ග.සේ - I | 1 | 1 | 0 |
| 5 | අභ්‍යන්තර විගණක | SL1 - 2016 A | ශ්‍රී.ලං.ග.සේ - I | 1 | 0 | 1 |
| 6 | නීති නිලධාරි | SL1 - 2016 A | | 1 | 0 | 1 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 6 | පරිපාලන නිලධාරි | MN7 - 2016 A | රා.ක.ස.සේ - අධි පන්තිය | 1 | 1 | 0 |
| 7 | භාෂා පරිවර්ථක | MN6 - 2016 A | භාෂා පරිවර්ථක සේවය | 2 | 1 | 1 |
| 8 | තොරතුරුහා සන්නිවේදන තාක්ෂණ නිලධාරි | MN6 - 2016 A<br>MT1 -2016A | ශ්‍රී.ලං.තොරතුරු තාක්ෂණ සේවය | 1 | 2 | මු.රෙ.71 මගින් අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| 9 | විමර්ශන සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 2 | 2 | 0 |
| 10 | පර්යේෂණ සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 0 | සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්රහණය වී ඇත. |
| 11 | ප්‍රතිපත්ති හා සැලසුම් සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 0 | |
| 12 | තොරතුරු තාක්ෂණ නිලධාරි | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 0 | |
| 13 | දත්ත කළමනාකරණ සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 1 | 0 |
| 14 | අයවැය සහකාර | MN4 - 2016 A | දෙපාර්තමේන්තුගත | 1 | 0 | 1 |
| 15 | සංවර්ධන නිලධාරි | MN4 - 2016 A | සංවර්ධන නිලධාරි සේවය - I/II/III | 4 | 9 | තනතුරු සංඛ්‍යාව 8 දක්වා වැඩි කිරීමට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. |
| 16 | රාජ්‍ය කළමනාකරණ සහකාර | MN2 - 2016 A | රා.ක.ස.සේ - I/II/III | 57 | 42 | 15 |
| 17 | රියදුරු | PL3 - 2016 A | රියදුරු සේවය | 5 | 3 | 2 |
| 18 | කාර්යාල සේවක සේවය | PL1 -2016 A | කා.සේ.සේ. - I/II/III | 15 | 7 | 8 |
| එකතුව | | | | **104** | **74** | **33** |

## 2017.12.31 දිනට කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුරු නාමය, සේවය හා පන්තිය | අනුමත කාර්ය මණ්ඩලය | සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 06 | 06 | |
| 02 | තෘතීය මට්ටම | 04 | 03 | 01 | |
| 03 | ද්වීතීය මට්ටම | 68 | 55 | 16 | 03* |
| 04 | ප්‍රාථමික මට්ටම | 20 | 10 | 10 | |
| | **එකතුව** | **104** | **74** | **33** | |

*දෙපාර්තමේන්තුගත නිලධාරීන් 3 දෙනෙක් සංවර්ධන නිලධාරී සෙවයට අන්තර්ග්‍රහණය වී ඇත

## තොරතුරු තාක්ෂණය හා කළමනාකරණය

2017 වර්ෂයේ දී නව පරිඝනක මෙහෙයුම් පද්ධතිය ස්ථාපිත කිරීම සිදුකරන ලද අතර ඒ සඳහා මූලික දත්ත සැකසීම් කටයුතු හා කරගෙන යනු ලැබීය. පළමු අදියර යටතේ අන්තර්ජාලය හරහා අයදුම්පත් භාර ගැනීම 2018 ජනවාරි මස ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත.

- නව පරිඝනක පද්ධතිය සඳහා කාර්ය මණ්ඩලය පුහුණු කිරීම
- නිර්දේශ නිකුත් කරනු ලබන ආයතන හා සාකච්ඡා පැවැත්වීම
- නව පද්ධතිය සඳහා අවශ්‍ය දෘඩාංග ස්ථාපිත කිරීම යන කොටස් දැනට නිම කර ඇත

**www.imexport.gov.lk** වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමත්, මහජනතාවට අවශ්‍ය තොරතුරු එමගින් දැනගැනීමට සැළසීමත් මෙමගින් ඉටු කරන අතර ආයතනයේ පරිඝනක පද්ධතිය නිරතුරුව පවත්වාගෙන යාමට දායකත්වය සපයයි.

## පුහුණු කිරීම් හා හැකියා වර්ධනය

දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ දැනුම වර්ධනය කර සේවාවන් ඉහළ කාර්යක්ෂමතාවයෙන් හා ඵලදායකත්වයෙන් යුතුව පවත්වාගෙන යාම සඳහා 2017 වර්ෂය තුළදී පහත පරිදි දේශීය සහ විදේශීය පුහුණු සඳහා නිලධාරින් යොමු කර ඇත.

### *දේශීය පුහුණු - සංවර්ධන නිලධාරී, රා.ක.ස/ කා.සේ.සේ* (වගුව අංක 2)

| අනු අංකය | ආයතනය | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව | දින වකවානු | වැය කළ මුදල |
|---|---|---|---|---|---|
| 01. | National Human Resources Development Council | Customer Care | 02 | 2017/01/10 | - |
| 02. | SDFL | Leadership & personality Development | 01 | 22017/02/17 | 5,000 |
| 03. | MILODA | CIGAS | 02 | 2017/01/24 25, 26 | 33,000 |
| 04. | SLIDA | Certificate Course in English | 01 | 2017/04/02 | 26,000 |
| 05. | SDFL | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය | 01 | 2017.03.02 | 5,000 |
| 06. | Miloda | Payroll | 02 | 2017/02/13,14,15 | 33,000 |
| 07. | ජාතික ශ්‍රම | ගිණුම්කරණ කාර්යභාරය හා | 04 | 2017/02/21, | 24,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | අධ්‍යනය ආයතනය | ප්‍රායෝගික භාවිතය | | 22 | |
| 08. | ප්‍රාග් ආයතනය | විනය කාර්යය පටිපාටිය | 01 | 2017.02.14 | 6,000 |
| 09. | මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව | Lecture on " Human Confidence | 04 | 2017.03.07 | - |
| 10. | Commerce Department | National Workshop on the WTO Agreement on Sanitary &phytosanitary measures & Technical Barriers to trade for Sri Lanka | 02 | 2017/02/20, 21 | - |
| 11. | SDFL | Public Procurement Procedures | 01 | 2017/02/27, 28 | 8,500 |
| 12. | Miloda | Diploma in English for professionals | 02 | | 50,000 |
| 13. | SDLF | Enhancing Skills of Drivers & Minor Employees | 02 | 2017/03/13, 14 | 17,000 |
| 14. | Ceylon Chamber of Commerce | What Business Needs to Know | 01 | 2017.04.03 | 3,500 |
| 15. | Sri Lanka Customs | EU – TTC Funded training Programme | 01 | 2017.04.19, 20 | - |
| 16. | National Human Resources Development Council | Lecture on " Top HR Trends – 2017 | 02 | 2017.05.04 | - |
| 17. | Miloda | Diploma in English for Junior Executives | 03 | 2017/04/22 සිට දින 10 | 75,000 |
| 18. | Miloda | Preparation of Bid documents and Tender Procedures | 01 | 2017/5/23,24 | 11,500 |
| 19. | SDFL | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වත්කම් අපහරණය | 02 | 2017/06/29, 30 | 17,000 |
| 21. | Ministry of Foreign Affairs | Department of Defense ( DOD ) International Counter proliferation Programme ( ICP ) International Dual Use Investigations | 03 | 2017/05/08 ,09,10,11,12 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| 22 | දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කල පුහුණු | ආනයන හාඅපනයන පාලන පනත තොරතුරු දැන ගැනීමේ පනත සහ නිලධාරීන්ගේ ආකල්ප වර්ධනය | 55 | 2017/06/24, 25 | 174,400 |
| 23 | Ministry of National Policies and Economic Affairs | Enhancement of Accounting skills of the Public Sector | 04 | 217/06/22 | - |
| 24. | Miloda | Financial Regulations in the public Sector | 01 | 2017/07/18,19 | 11,500 |
| 25. | Department of National Budget | Addendum one to the Budget Call -2018 | 03 | 2017/05/8,26 | - |
| 26. | SLIDA | Certificate course in English | 01 | 2017/12/10 | 26,000 |
| 27. | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | ආයතනිකඵලදායිතාවයඋදෙසා කාර්යාලකාර්යයසහයකයින් ගේකාර්යභාරය | 06 | 2017/08/25 | 21,000 |
| 28. | ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය | විද්‍යාත්මක පිරිමැසුම්දායක හා ආරක්ෂිත රිය පැදවීම | 02 | 2017/09/21 | 6,000 |
| 29. | ප්‍රාග් ආයත නය | විගණන විමසුම්වලට පිලිතුරු සැපයීම | 03 | 2017/09/07 | 18,000 |
| 30. | දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කල පුහුණු | බෝනොවන රෝග පිළිබඳ නිළධාරීන් දැණුවත් කිරීම. | සියළුම | 2017/08/25 | 2,000 |
| 31. | E T Properties | First Aid Training | 01 | 2017/11/11 | 2,500 |
| 32. | වෘත්තීය සංවර්ධන ආයතනය | ධාරිතාවර්ධනපුහුණුවැඩසටහන | 02 | 2017/12/07 08, 14, 15 | 40,000 |
| 33. | ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය | ඵලදායිතාවය සඳහා තොරතුරු තාක්ෂණය | 01 | 2017/11/28 | 5,000 |
| 34. | ජාතික ශ්‍රම අධ්‍යනය ආයතනය | කාර්යාල කළමණාකරණ හා මුදල් රෙගුලාසි | 02 | 2017/12/07, 08 | 12,000 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 35. | Department of State Accounts | Training Programme & Seminar on New CIGAS for year 2018 | 01 | 2017/12/27 | - |
| 36. | Ministry of Finance | Introductory Workshop for ITMIS | 01 | 2017/10/03 | - |
| 37. | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | මොන්ට්‍රියල් සන්ධානය හා පාලන යාන්ත්‍රණය පිළිබඳ දැණුවත් කිරීමේ වැඩ සටහන | 60 | 2017/10/28 | 250,605 |
| 38. | දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කල පුහුණු | Happiness of Life | 65 | 2017/12/09 | 289,799.99 |

## දේශීය පුහුණු - මාණ්ඩලික

වගුව අංක 3

| අනු අංකය | ආයතනය | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වු නිළධාරීන් සංඛ්‍යාව | දින වකවානු | වැය කළ මුදල |
|---|---|---|---|---|---|
| **01.** | SLIDA | Seminar on “ Role of the Public Servant in Implementing Budget Proposals of 2018 | 02 | 2017/11/13 | - |
| **02.** | National Dangerous Drugs Control Board | National Training workshop for Building Capacities of Drug Enforcement Personnel of Sri Lanka on Controlling Pharmaceutical Drugs Trafficking | 02 | 2017/5/06, 07 | - |
| **03.** | SLIDA | Capacity Building Programme for the officers of SLAS Class | 01 | 2017.04.03 – September 2019 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 111 | | | |
| **04.** | The Institute of Chartered Accountants | Assets Managements | 01 | 2017/02/13,14 | 8,000 |
| **05.** | SLIDA | SLIDA Diploma in English | 02 | 2017/12/04 | 42,000 |
| | Sri Lanka Foundation | Project proposal writing | 01 | 2017/12/13,14 | 6,000 |
| **06.** | Adams Skills Development Centre | Microsoft Excel – Advanced Analysis tools | 01 | 2017/12/11,12 | 16,000 |
| **07.** | Department of State Accounts | Training Programme & Seminar on New CIGAS for year 2018 | 01 | 2017/12/27 | - |
| **08.** | SDFL | Leadership & personality Development | 01 | 2017/02/17 | 5,000 |
| **09.** | Sri Lanka Customs | EU – TTC Funded training Programme | 02 | 2017/04/19,20 | - |
| **10.** | Ministry of Finance | Introductory Workshop for ITMIS | 01 | 2017/10/03 | - |
| **11.** | ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව | රාජ්‍ය ලේඛන පරිපාලනය හා ලේඛනාරක්ෂක නීතිය | 01 | 2017/07/18 | - |
| **12.** | බලශක්ති ඉල්ලුම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යය සාධන බලකාය | රාජ්‍ය ආයතන වල බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය පිළිබඳ ජාතික වැඩ සටහන | 01 | 2017/11/09, 10 | - |
| **13.** | Ministry of Health , Nutrition & Indigenous Medicine | National Stakeholder Workshop for risk –based food Import Control within a One health framework | 01 | 2017/11/30 | - |
| **14.** | SLIDA | MPM | 02 | Application processing fee | 4,000 |

## විදේශීය පුහුණු - සංවර්ධන නිලධාරී

වගුව අංක 04

| අනු අංකය | පැවැත්වූ රට | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | දින වකවානු |
|---|---|---|---|---|
| 01 | චීනය | 2017 Seminar for Import & Export Commodity Quality and Safety Supervision Officials from Developing Countries | 02 | 2017.04.01 සිට 2017.04.21දක්වා |
| 02 | ඇමරිකා එක්සත් ජනපදය | Senior Policy Exchange | 01 | 2017.05.15සිට 2017.05.18දක්වා |
| 03 | චීනය | 2017 Seminar on food Safety Management for Countries along the Belt and Road | 01 | 2017.05.04සිට 2017.05.24දක්වා |
| 04 | චීනය | “2017 Training Course on Basic Software Application Technology for Asian and European Countries | 01 | 2017.06.12සිට 2017.07.11දක්වා |
| 05 | චීනය | 2017Seminar on Import & Export Management and Protection of Endangered Species for officials from Developing Countries | 01 | 2017.08.29සිට 2017.09.18දක්වා |

## විදේශීය පුහුණු - මාණ්ඩලික

වගුව අංක 05

| අනු අංකය | පැවැත්වූ රට | පුහුණු පාඨමාලාවේ නම | සහභාගී වූ නිළධාරීන් සංඛ්‍යාව | දින වකවානු |
|---|---|---|---|---|
| 01 | ඇමරිකා එක්සත් ජනපදය | EXBM programme- USA | 01 | 2017.03.27 සිට 2017.04.07දක්වා |

| | | | | |
|---|---|---|---|---|
| 02. | ඇමරිකා එක්සත් ජනපදය | Senior Policy Exchange - USA | 01 | 2017.05.15සිට2017.05.18 දක්වා |
| 03. | නෙදර්ලන්තය | Basic Course for personal of National Authorities Involved in the National Implementation of the Chemical Weapons Convention - Netherlands | 01 | 2017.04.03සිට 2017.04.07දක්වා |

## 2017 වර්ෂය තුළ දී ප්‍රකාශයට පත්කළ නව රෙගුලාසි

ආනයනයන් හා අපනයනයන් පිළිබඳ රජයේ ප්‍රතිපත්ති ක්‍රියාවට නංවමින් නව රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට පහත සඳහන් අතිවිශේෂ ගැසට් නිවේදනයන් ප්‍රකාශයට පත් කර ක්‍රියාත්මක කරන ලදී.

| අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කළ දිනය | අතිවිශේෂ ගැසට් පත්‍ර අංකය | අන්තර්ගතය |
|---|---|---|
| 19.05.2017 | 2019/24 | වසර 10 කට වඩා පැරණි කොන්ක්‍රීට් පොම්ප ට්‍රක්රථ බලපත්‍ර පාලනයට යටත් කිරීමේ රෙගුලාසි |
| 15.08.2017 | 2032/10 | ආනයනික විද්‍යුත් ජේනු සහ කෙවෙනි සඳහා ප්‍රමිතිය හා ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම පිළිබඳ රෙගුලාසි |
| 02.10.2017 | 2039/4 | ප්‍රති අපනයනය අරමුණු කර ගිනිමින් ආනයනය කරනු ලබන තේ සඳහා නිකුත් කරන බලපත්‍ර ගාස්තු සංශෝධනය සඳහා වන රෙගුලාසි |
| 09.11.2017 | 2044/40 | ආනයන පාලනය හා තහනම් කරන ලද අයිතම ලැයිස්තුව සඳහා රෙගුලාසි |
| 09.11.2017 | 2044/41 | අපනයන පාලනය කරන ලද අයිතම ලැයිස්තුව සඳහා රෙගුලාසි |

## වසර 10 කට වඩා පැරණි කොන්ක්‍රීට් පොම්ප ට්‍රක්රථ බලපත්‍ර පාලනයට යටත් කිරීමේ රෙගුලාසි

මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක TIP/TP/01/12/(8) සහ 2017.02.22 දිනැති ලිපියට අනුව, ආදායම් සංරක්ෂණ නියෝග 2/2017 යටතේ (අංක 2006/42 සහ 2017.02.16 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය) කොන්ක්‍රීට් පොම්ප ට්‍රක්රථ ආනයනයට අදාළ රෙගුලාසි සංශෝධනය කරන ලදි. ඒ අනුව, උක්ත ආදායම් සංරක්ෂණ නියෝග ප්‍රකාරව නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 02ක් හඳුන්වා දෙන ලදි.

8705.90.31 - වසර 10කට වඩා නොපැරණි කොන්ක්‍රීට් පොම්ප ට්‍රක් රථ

8705.90.32 - වසර 10කට වඩා පැරණි කොන්ක්‍රීට් පොම්ප ට්‍රක් රථ

තවද, වසර 10කට වඩා පැරණි කොන්ක්‍රීට් පොම්ප ට්‍රක්රථ ආනයනය කළමනාකරණය සඳහා සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 8705.90.32 ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම නිර්දේශ කර ඇත. නව සංයෝජිත සංකේතාංක හඳුන්වා දීමට පෙර, කොන්ක්‍රීට් පොම්ප ට්‍රක්රථ පොදුවේ සංයෝජිත වර්ගීකරණ උපබෙදුම් 8705.90 (වෙනත්) යටතට ඇතුළත් වී තිබුණි.

ඉදිකිරීම් ක්ෂේත්‍රය වනාහි ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම කර්මාන්තය බවට පත් වී ඇත. එබැවින්, ඉදිකිරීම් කටයුතු සඳහා පහසුකම් සැපයීම මගින් ආර්ථිකමය සහ සාමාජීය වශයෙන් වාසි රැසක් මෙරටට ලබා ගත හැකි වේ. එමනිසා, ඉදිකිරීම් කර්මාන්ත ක්ෂේත්‍රයේ ඉල්ලීම පරිදි නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 02ක් හඳුන්වා දෙනු ලැබ ඇති අතර, සංකේතාංක 8705.90.32 ආනයන හා අපනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම නිර්දේශ කරනු ලැබ ඇත. මෙමගින් කොන්ක්‍රීට් පොම්ප ට්‍රක්රථ ආනයනය නිසි පරිදි නියාමනය සිදු වනු ඇති අතර, මේ නිසා අවසානයේදී ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රවර්ධනය සඳහා දායකත්වයක් ලැබෙනු ඇත.

ඉහත කරුණු අනුව, වසර 10කට වඩා පැරණි කොන්ක්‍රීට් ට්‍රක්රථ ආනයනය පාලනය සඳහා බලපත්‍ර ලබා ගත යුතු අයිතම ලැයිස්තුවට ඇතුළත් කරන ලදී. එබැවින්, ඉහත යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා අංක 2011/10 සහ 2017.03.21 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කරන ලදි.

ඒ අනුව, අංක 2019/24 සහ 2017.05.19 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල අතර 2017 ජුනි මස 20 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා දෙන ලදි.

## ආනයනික විද්‍යුත් ජේනු සහ කෙවෙනි සඳහා ප්‍රමිතිය හා ආනයන බලපත්‍ර පාලනයට යටත් කිරීම පිළිබද රෙගුලාසි

විදු 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලි බල පනතේ 4(1) වගන්තියට අනුව විදුලි උත්පාදනය, සම්ප්‍රේෂණය, බෙදාහැරීම, සැපයීම හෝ විදුලිය භාවිතය හේතුවෙන් පැන නැගිය හැකි අනතුරුදායක තත්වයන්ගෙන් මහජනතාව ආරක්ෂාකිරීම සඳහා මහජන උපයෝගීතා කොමිෂන් සභාව විසින් පියවර ගත යුතු වේ. විදුලි සැර වැදීම් අනතුරු සහ ගිනිගැනීම් ආදි සිදුවීම් සහ අනතුරු වලට බලපා ඇති මූලික හේතුවක් ලෙස විවිධාකාර ජේනු, කෙවෙනි සහ බාල වර්ගයේ විදුලි උපකරණ, ඇඩප්ටර සහ විදුලි දිගු භාවිතය හඳුනාගෙන තිබේ. විදුලි උපකරණවල සවිකර ඇති ජේනු කෙවෙනි සමග නොගැලපෙන අවස්ථාවලදී ඇඩප්ටර භාවිත කිරීමට සිදුවන නිසා අනතුරු මෙන්ම දුෂ්කරතාවලට ද පාරිභෝගිකයින් මුහුණ පායි. විදුලිබල කර්මාන්තයේ නියාමන ආයතනය වන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ සහ විදුලි ජේනු සහ කෙවෙනි වල ප්‍රමිතිය පිළිබද නිර්දේශ ඉදිරිපත්කල ක්‍රියාකාරි කමිටුවේ

නිර්දේශ අනුව අමාත්‍ය මණ්ඩලය විසින් 2016 අගෝස්තු 16 වන දින විදුලි පේනු සහ කෙවෙනි සඳහා ජාතික ප්‍රමිතියක් හඳුන්වාදීමට තීරණය කරන ලදී. ඒ අනුව ජී වර්ගයේ ඇම්පියර 13 පේනු සහ කෙවෙනි ( කොටු හැඩයේ කූරු සහිත පේනු සහ කොටු හැඩයේ සිදුරු සහිත කෙවෙනි) මෙරට ජාතික ප්‍රමිතිය වශයෙන් සම්මත කර ඇත.

මෙම ජාතික ප්‍රමිතිය ක්‍රියාවට නැගීම සඳහා පහත සඳහන් කාල සටහන අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

I. ජී වර්ගයේ ඇම්පියර 13 පේනු සහ කෙවෙනි ශ්‍රී ලංකාවේ ප්‍රමිතිය වශයෙන් පිළිගැනීම
II. 2016 අගෝස්තු 16 සිට අවුරුද්දක කාලයක් දක්වා ඉඩදෙමින්, 2017 අගෝස්තු 16 වන දිනයෙන් පසුව ජී වර්ගයේ නොවන පේනු, කෙවෙනි, බාල වර්ගයේ බහු කෙවෙනි සහ විදුලි දිගු, ජී වර්ගයේ නොවන පේනු සහිත විදුලි උපකරණ ආනයනය සහ නිෂ්පාදනය තහනම් වේ.
III. 2016 අගෝස්තු 16 සිට වසර 2ක කාලයක් දක්වා ඉඩදෙමින්, 2018 අගෝස්තු 16 වන දිනයෙන් පසුව ජී වර්ගයේ නොවන පේනු, කෙවෙනි, බාල වර්ගයේ බහු කෙවෙනි සහ විදුලි දිගු, ජී වර්ගයේ නොවන පේනු සහිත විදුලි උපකරණ අලෙවි කිරීම තහනම් වේ.
IV. දැනට පවත්නා අභ්‍යන්තර රැහන් පද්ධති හා ඒවාට සවිකර ඇති පේනු සහ කෙවෙනි මෙන්ම අනුමත දිනයේ සිට වසර දෙකක කාලය ඇතුළත අලෙවිකරන ලද පේනු සහ කෙවෙනි ඒවා භාවිත කළ හැකි උපරිම කාලය දක්වා භාවිත කළ හැකි වේ.
V. පවත්නා රැහැන් පද්ධති, පේනු සහ කෙවෙනි ඒවායේ ක්‍රියාකාරි කාලය දක්වා භාවිත කල හැකි වන සේ පහත සඳහන් පහසුකම් සලසා ඇත.
   a) ඉවත් කල යුතු ඇම්පියර 5 කෙවෙනි සඳහා විශේෂයෙන් ලකුණු කල ජී වර්ගයේ කෙවෙනි වෙළඳපාලෙහි අලෙවිකිරීම
   b) ඇම්පියර 5 පේනු සහ ඇම්පියර 13 කෙවෙනි සම්බන්ධ කිරීම සඳහා ඇඩප්ටර වෙළඳපලින් මිලදී ගැනීමට පහසුකම් සැළසීම

සම්මත විදුලි දිගු ආනයන (ප්‍රමිති හා තත්ව) පාලන රෙගුලාසිය සංශෝධනය කිරීම හරහා පමණක් බාල වර්ගයේ ඇම්පියර 13 පේනු, කෙවෙනි, ඇඩප්ටර, විදුලි දිගු ආනයනය කිරීම තහනම් කල නොහැකි ය. තවදුරටත් හෝටල් ආදි ස්ථානවලදී රැවුල බෑමේ උපකරණ සම්බන්ධ කෙරෙන කෙවෙනි. පොදු කෙවෙනි හා සංචාරක ඇඩප්ටර භාවිතයට ඉඩදිය යුතු වේ. ඒ සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අනුමැතියට යටත්ව ආනයනය සඳහා මෙම දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක් ලබාගත යුතු බවට ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලදි.

ඒ අනුව, අංක 2032/10 සහ 2017.08.15 දිනැති අතිවිශේෂ ගැසට් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අනුමැතිය 2017 සැප්තැම්බර් 22 වන දින ලබා දෙන ලදි.

## ප්‍රති අපනයනය අරමුණු කරගනිමින් ආනයනය කරනු ලබන තේ සඳහා වන බලපත්‍ර ගාස්තු සංශෝධනය සඳහා වන රෙගුලාසි

ප්‍රතිඅපනයනය අරමුණු කරගෙන මෙරටට ආනයනය කරනු ලබන තේ සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් පූර්ව අනුමැතියක් ලබාගත යුතු අතර එම අනුමැතිය පදනම් කරගෙන ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවෙන් බලපත්‍රයක් ලබාගත යුතුය. ආනයනකරුවන්ට අදාල අයඳුම්පත්‍රය නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය රුපියල් 500.00 ක ගාස්තුවක් අය කරනු ලබන අතර ආනයනය කරනු ලබන එක් තේ කිලෝවක් සඳහා රු. 5.00 ක ගාස්තුවක් ද අයකරනු ලැබේ. ඊට අමතරව ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව මගින් එසේ ආනයනය කරනු ලබන තේ වල මි.රැ.ගැ. වටිනාකම මත 1% ක බලපත්‍ර ගාස්තුවක් ද අයකරනු ලැබේ. ශ්‍රී ලංකා රේගුව විසින් ආනයනය කරනු ලබන තේ

නිදහස් කරනු ලබන්නේ ඉහත සඳහන් කරනු ලැබූ අනුමැතීන් දෙකම පදනම් කර ගනිමිනි. තේ කර්මාන්තය උදෙසා පහසුකම් සැපයීමට, ප්‍රතිඅපනයනය අරමුණු කරගෙන මෙරටට ආනයනය කරනු ලබන තේ සඳහා මි.ර.ගැ වටිනාකමින් 1% ක් වූ ආනයන බලපත්‍ර ගාස්තුව අහෝසි කරන මෙන් තේ ආනයනකරුවන් විසින් 2017 අයවැය සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලදි. එම ඉල්ලීම පදනම් කර ගනිමින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හා සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය එම මි.ර.ගැ වටිනාකමින් 1% ක් වූ බලපත්‍ර ගාස්තුව අහෝසි කිරීම සඳහා 2017.05.30 දිනැති අංක 17/1123/726/027 හවුල් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද අතර එමගින් 1969 අංක 01 දරන ආනයන හා අපනයන පාලන පනත යටතේ නිකුත් කර තිබූ අංක 1953/28 හා 2016.02.11 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ අංක 46 තීරය ඉවත් කොට එහි බලපත්‍ර ගාස්තුව රු. 1000.00 ලෙස සංශෝධනය කරන ලදි. මෙම යෝජනාව 2017.06.28 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදි.

එහි බලපත්‍ර ගාස්තුව සංශෝධනය කර මුද්‍රණය කරනු ලැබූ අංක 2039/4 2017.10.02 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය නීතිමය අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල අතර ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අනුමැතිය 2017 නොවැම්බර් 20 දින ලබා දෙන ලදි.

## ආනයන / අපනයන පාලනය හා තහනම් කරන ලද අයිතම ලැයිස්තුව සඳහා රෙගුලාසි

ශ්‍රී ලංකාව 1968 සිට ජගත් රේගු සංවිධානයේ සාමාජිකත්වය දරණ බැවින්, සංයෝජිත වෙළඳ භාණ්ඩ විස්තර සටහන හා වර්ගීකරණ සංකේත ක්‍රමය පිළිබඳ වූ අන්තර්ජාතික සම්මුතිය ක්‍රියාත්මක කිරීමට බැඳී ඇත. එම සම්මුතියේ 3 වන වගන්තිය ප්‍රකාරව රේගු තීරු බදු හා සංඛ්‍යාන නාමාවලිය, සුසංයෝජිත වර්ගීකරණ ක්‍රමය සමග අනුගත විය යුතුය.

සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සෑම වසර 4 ටම වරක් සංශෝධනය කරනු ලැබේ.ඒ අනුව 2012 සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ක්‍රමය 2017 සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ක්‍රමය ලෙස සංශෝධනය විය යුතුය. රේගු සහයෝගිතා මණ්ඩලය විසින් පවතින අංක 6කින් යුතු සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා නව සංශෝධන නිර්දේශ කරමින් 2012 සංයෝජිත වර්ගීකරණ සංකේතාංක සඳහා 6වන සංශෝධනය හඳුන්වා දෙනු ලැබීය. එය 2017 සංයෝජිත වර්ගීකරණ ක්‍රමය ලෙස නව මුහුණුවරකින් පිළිගෙන ඇත. මෙම 2017 නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ක්‍රමය, ජාත්‍යන්තර වෙළදාම් රටාවේ හා තාක්ෂණයේ සියුම් වෙනස්කම් යථාවත් ලෙස පවත්වා ගැනීම තහවුරු කරයි. මේ සංශෝධන, කෘෂිකාර්මික අංශය, රසායන ද්‍රව්‍ය, දැව, ඇඟලුම්, මූලික ලෝහ, යන්ත්‍රෝපකරණ, ප්‍රවාහන හා තවත් අංශ කිහිපයක් ආවරණය කරයි.

ජගත් රේගු සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව, එහි අවශ්‍යතාවන්ට අනුගතවෙමින් පවතින ජාතික රේගු සංකේතාංක ක්‍රමය අංක අටකින් යුතු සංයෝජිත වර්ගීකරණ සංකේතාංක ක්‍රමයක් ලෙස සංශෝධන සිදු කර ඇත. එම සංශෝධන, ආදායම් ආරක්ෂණ පනත ලෙස ප්‍රසිද්ධ කර ඇත.

මෙයට සමගාමීව ආනයන හා අපනයන පාලන පනත යටතේ ප්‍රසිද්ධ කර ඇති රෙගුලාසි (පාලනයට යටත් අයිතම) නව අයිතම ඇතුලත් කිරීමකින් තොරව සංශෝධනය කරන ලදි. ඒ අනුව පහත සඳහන් ගැසට් පත්‍ර මෙමගින් පරිච්ඡින්න කරනු ලැබීය.

| අති විශේෂ ගැසට් අංක. | දිනය | විස්තරය |
|---|---|---|
| 1813/14 | 05.06.2013 | ආනයන පාලනය කරන ලද |

| | | |
|---|---|---|
| | | අයිතම ලයිස්තුව |
| 1821/40 | 01.08.2013 | හයිඩ්රො ක්ලෝරෝ ෆ්ලෝරෝ කාබන් (HCFCs) ආනයන පාලනයට යටත් කිරිම |
| 1837/41 | 21.11.2013 | එච්.එස් අංක 87.03 හා 87.04 සංශෝදනය කිරිම |
| 1846/16 | 21.01.2014 | එච්.එස් අංක 87.04 හා 87.05 සංශෝදනය කිරිම |
| 1882/40 | 02.01.2014 | ලින්නා මසුන් ආනයනය තහනම් කිරිම |
| 1885/50 | 24.10.2014 | එච්.එස් අංක 87.02, 87.05 හා 87.11 සංශෝදනය කිරිම |
| 1918/22 | 11.06.2015 | ග්ලෆෝසෙට් ආනයනය තහනම් කිරිම |
| 1970/9 | 07.06.2016 | එච්.එස් අංක සංශෝදනය කිරිම |
| 1992/74 | 11.11.2016 | ටින් මාළු හා මැකරල් මසුන් ආනයනය බලපත්‍ර පාලනයට යටත් කිරිම |
| 1999/47 | 30.12.2016 | වාහනවල ආයු කාලය නිර්ණය, නව සංයෝජිත වර්ගීකරණ සංකේතාංක හඳුන්වා දීම සහ කෘත්‍රිම ලිහිසිකාරක බලපත්‍ර පාලනයට යටත් කිරීම |
| 2019/24 | 19.05.2017 | කොන්ක්‍රීට් පොම්ප ට්‍රක්රථ බලපත්‍ර පාලනයට යටත් කිරීම |
| 2032/10 | 15.08.2017 | ජේනු සහ කෙවෙනි බලපත්ර පාලනයට යටත් කිරීම |

2013 ජුනි 05 දිනැති අංක 1813/14, 2014 ඔක්තෝබර් 02 දිනැති අංක 1882/40 හා 2015 ජුනි 11 දිනැති අංක 1918/22 දරණ අති විශේෂ ගැසට් පත්ර යන්හි (IV) වන උපලේඛනය නව තහනම් අයිතමයන් ඇතුල් කිරීමෙන් සංශෝධනය කරනු ලැබීය. 2013 ජුනි 05 දිනැති අංක 1813/14 ගැසට් පත්රයේ (IV) වන උපලේඛනය වු මොන්ට්රියල් සන්ධානය යටතේ පාලනය වන මෙම නව අයිතමයන් මීන් පෙර ආනයන පාලන අයිතම ලැයිස්තුවේ ලැයිස්තු ගත කොට තිබුණි. නමුත් මොන්ට්රියල් සන්ධානයේ අදියරගත බැහැර කිරීමේ ක්‍රමවේදයට යටත් වූ ඇමුණුම B හි කාණ්ඩ I හා ඇමුණුම C හි කාණ්ඩ II හා III හි වන මෙම රසායන ද්‍රව්‍ය මෙම ගැසට් පත්‍රයේ ආනයනය තහනම් භාණ්ඩ ලේඛනයට ඇතුලත් කොට ඇත.

ඒ අනුව මුද්‍රණය කරනු ලැබූ 2017.11.09 දිනැති අංක 2044/40 සහ 2044/41 දරන අතිවිශේෂ ගැසට් නිවේදන නීතිමය අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අනුමැතිය 2017 දෙසැම්බර් 11 වන දින ලබා දෙන ලදි.

## ආදායම් විශ්ලේෂණය - 2017

2017 වර්ෂය සඳහා ඇස්තමේන්තුගත අදායම රුපියල් මිලියන 1200 වූ අතර එය 2017 ජූලි මස නැවත රුපියල් මිලියන 1350 ක් ලෙස සංශෝදනය කරන ලදි. දෙපාර්තමේන්තුව 2017 වර්ෂය තුළදී රුපියල් මිලියන 1487 ක ආදායමක් උපයා ගැනීමට සමත් විය. 2016 වර්ෂය හා සැසඳීමේදී ආදායම 35.18% කින් වැඩි වී ඇත. එය පහත පරිදි වර්ගීකරණය කර ඇත.

බලපත්‍ර ආදායම -රු1,487,761,561.39

මෙම බලපත්‍ර ආදායම තුළ අතිරේක ගාස්තු සහ සංශෝධන ගාස්තු ද ඇතුළත් වේ.

### I. ආදායම - 2017

ආදායම පිළිබඳ විස්තර පහත වගුව මගින් ඉදිරිපත් කර ඇත.

වගුව අංක 06

| විස්තරය | 2016 සත්‍ය ආදායම රු. | 2017 අනුමත ඇස්තමේන්තුව රු. | 2017 ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව රු. | 2017 සත්‍ය ආදායම රු. |
|---|---|---|---|---|
| ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු | 1,370,847,281 | 1,200,000,000 | 1350,000,000 | 1,487,761,561.39 |

## වියදම් විශ්ලේෂණය - 2017

### I. පුනරාවර්තන වියදම් සහ මූලධන වියදම

2017 වර්ෂය සඳහා රුපියල් මිලියන 56.492 ක් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා ප්‍රතිපාදනය කර ඇත.වියදම රුපියල් මිලියන 67.13ක් දරා ඇත. එය මුළු ප්‍රතිපාදනයෙන් 91% ක් වේ. විස්තර පහත පරිදි දක්වා ඇත.

ශීර්ෂ අංකය : 296

අමාත්‍යාංශය : සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යාන්තර වෙළඳ

ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව

වැඩසටහන් අංකය : 01

වාහපෘතිය : 01

## II. මූල්‍ය ප්‍රභවයන්

ඒකාබද්ධ අරමුදල මගින් දේශීය අරමුදල් යටතේ වෙන් කර දුන් මුදල් වියදම් කිරීමේදී කාර්යක්ෂමව හා ඵලදායීව වියදම් කිරීමට පියවර ගෙන ඇත. (වගුව අංක 07)

වගුව අංක 07


| විස්තරය | 2016 සත්‍ය වියදම රු. | 2017 සත්‍ය වියදම රු. |
|---|---|---|
| මුළු වියදම | **59,660,338.39** | **67,131,842.30** |

## ආදායම් සහ වියදම් විශ්ලේෂණය - 2017

දෙපාර්තමේන්තුවේ මුළු වාර්ෂික වියදම රුපියල් මිලියන 67ක් වන අතර වාර්ෂික ආදායම රුපියල් මිලියන 1487 ක ආදායමක් උපයා ඇත. පහත වගුව මගින් දෙපාර්තමේන්තුවේ අදායම් හා වියදම් සාරාංශය මාසිකව ගණනය කර දක්වා ඇත.

| මාසය | අදායම (රු) | වියදම (රු) |
|---|---|---|
| ජනවාරි | 142,672.004.57 | 4,271,673.80 |
| පෙබවරවාරි | 105,483,313.68 | 4,160,616.56 |
| මාර්තු | 117,636,876.67 | 6,451,697.80 |
| අප්‍රේල් | 111,620,164.93 | 5,258,606.63 |
| මැයි | 87,962,076.73 | 5,445,291.90 |
| ජුනි | 94,133,209.48 | 4,446,567.77 |
| ජුලි | 132,259,725.65 | 4,855,784.49 |
| අගෝස්තු | 175,337,726.83 | 4,798,237.50 |
| සැප්තැම්බර් | 98,937,192.70 | 4,367,851.05 |
| ඔක්තෝබර් | 100,131,077.02 | 4,463,217.67 |
| නොවැම්බර් | 162,391,418.13 | 4,185,761.13 |
| දෙසැම්බර් | 159,196,775.00 | 14,426,536.00 |
| **Total** | **1,487,761,561.39** | **67,131,842.30** |

## ආදායම් හා වියදම් විශ්ලේෂණය - 2017





## පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සහ ලැබූ අදායම

## පසුගිය වසර 5 තුළ නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව

| අයිතමය | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| ඖෂධ | 2104 | 2500 | 2732 | 2,450 | 2,205 |
| වාහන | 1288 | 958 | 739 | 797 | 690 |
| රසායන ද්‍රව්‍ය | 4301 | 4339 | 3844 | 3,684 | 3,644 |
| විදුලි සංදේශඋපකරණ හ වෙනත් | 3406 | 3523 | 4338 | 4,399 | 3,401 |
| විවිධ ආනයන හාඅපනයන | 1427 | 2148 | 3274 | 4,168 | 4,947 |


## පසුගිය වසර පහ තුළ එක් එක් ඒකක මගින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව




## පසුගිය වසර 5 තුළ ඉපැයූ බලපත්‍ර ආදායම

වගුව අංක 13

| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| ඖෂධ | 83,036,455 | 124,551,191 | 165,323,691 | 209,568,743.70 | 220,396,338.63 |
| වාහන | 125,202,590 | 159,721,793 | 311,027,758 | 293,250,180.66 | 180,509,698.87 |
| රසායන ද්‍රව්‍ය | 190,727,940 | 298,927,118 | 248,677,073 | 310,511,640.29 | 386,316,943.95 |
| විදුලි සංදේශඋපකරණ හ වෙනත් | 46,973,837 | 57,901,028 | 262,610,141 | 422,736,764.24 | 518,785,898.77 |
| විවිධ ආනයන භාඅපනයන | 12,059,178 | 28,414,399 | 94,895,008 | 122,142,866.85 | 172,521,812.69 |
| ප්‍රතිපත්ති | | | 6,620,319 | 12,244,795.95 | 9,230,868.48 |
| වෙනත් | | | | 392,289.57 | 750,420.00 |
| එකතුව | **458,000,000** | **669,515,529** | **1,089,153,990** | **1,370,847,281.26** | **1,488,511,981.39** |




## පසුගිය වසර 5 තුළ බලපත්‍ර ආදායම සහ බලපත්‍ර සංඛ්‍යාව පිළිබඳ දත්ත සමාලෝචනය

ගත වූ වසර 5 තුළ එක් එක් අංශ විසින් නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව සහ ලැබූ ආදායම ඉහත පරිදි පෙන්වා දිය හැකිය.

### ඖෂධ - ඒකක 1

ඖෂධ සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව යම් තරමකින් පහත ගොස් ඇති නමුත් ආදායම ඉතා ඉහළ තලයකට පැමිණ ඇත. ඒ සඳහා ඉහත සඳහන් රුපියල අවප්‍රමාණය වීම සහ 2016 වර්ෂයේදී ඖෂධ සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වේ යැයි සිතා සමූහ බලපත්‍ර විශාල ප්‍රමාණයක් ලබා ගැනීම හේතු විය හැකිය.

### වාහන - ඒකක 2

2015 වර්ෂය දක්වා පාවිච්චි කරන ලද වාහන ආනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාවේ පහත යාමක් දක්නට ලැබුණත් 2016 වර්ෂයේ සුළු ඉහළ යාමක් දක්නට ලැබේ. නමුත් 2017 වර්ෂයේ නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය හා බලපත්‍ර ආදායමද පහත යාමක් දක්නට ඇත.

## රසායන ද්‍රව්‍ය- ඒකක 3

2014 වර්ෂය රසායනික ද්‍රව්‍ය ආනයනය සඳහා වැඩිම බලපත්‍ර සංඛ්‍යාවක් නිකුත් කරන ලද හා එමගින් වැඩිම ආදායමක් උපයන ලද වර්ෂය ලෙස වාර්තාගත වුවද, පසුගිය වසර 3 තුළම නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව පහල යාමක් දක්නට ඇත. එහෙත් රුපියල අවප්‍රමාණය වීම නිසා බලපත්‍ර ආදායම ඉහළ ගොස් ඇත. රසායනික ද්‍රව්‍ය අතරින් ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රමුඛත්වයක් ගන්නා අතර එය රටේ නිෂ්පාදන ක්‍රියාවලියේදී සුලභව යොදා ගනී. 2015, 2016 හා 2017 වර්ෂවලදී රටේ ආර්ථිකයේ නිෂ්පාදන අංශයේ අඩු ප්‍රසාරණයක් පෙන්වා තිබීම රසායනික ද්‍රව්‍ය ආනයනය කෙරෙහි බලපෑම් කර ඇත.

## විදුලි සංදේශ උපකරණ හා වෙනත්- ඒකක 4

විදුලි සංදේශ උපාංගයන් පිළිබද සැලකීමේදී නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව මෙන්ම, ඉන් උපයන ලද ආදායමෙහිද සීඝ්‍ර වර්ධනයක් පෙන්වා ඇත. සන්නිවේදන උපාංග ආනයනයේදී ජංගම දුරකථන ආනයනයට ප්‍රමුඛත්වයක් ලැබී ඇත. 2016 හා 2017 වර්ෂවල සන්නිවේදන ක්ෂේත්‍රයේ වාර්තාගත වර්ධනයක් පෙන්වා ඇති අතර, එම වසර 2 තුළ මහා පරිමාණ ව්‍යාපෘති රැසක්ද ක්‍රියාත්මක වී ඇත.

## විවිධ ආනයන හා අපනයන - ඒකක 5

ඒකක 5 විසින් නිකුත් කරන ලද බලපත්‍ර ප්‍රමාණය ඉතා වේගයෙන් ඉහළ ගොස් ඇති අතර ආදායමද පසුගිය වර්ෂ කිහිපය තුළ ඉහල වර්ධනයක් දක්නට ඇත. සත්ව නිශ්පාදන ආනයනය සඳහා නිකුත් කරන ලද බලපත්‍ර ඉතා ඉහළ අගයක් ගන්නා අතර එම ක්ෂේත්‍රයේ පැහැදිලි ඉහළ නැගීමක් පසුගිය වර්ෂය තුළ වාර්තා වී ඇත.

## ප්‍රතිපත්ති අංශය

1969 අංක 01 දරණ ආනයන හා අපනයන පාලන පනතට අනුකූලව ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් මැදිහත් වීම සහ ප්‍රතිපත්තිමය කරුණු සම්බන්ධයෙන් පැනනගින ගැටළු සඳහා විසඳුම් ලබා දීම මෙම ඒකකයේ ප්‍රධාන කාර්ය වේ.

එහිදී උක්ත පනත පාදක කොට ගෙන රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීම සඳහා ගැසට් නිවේදන සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ඊට අමතරව ආනයන හා අපනයන වෙළඳාම තුළ සිදුවනු ලබන විදේශ විනිමය ගනුදෙනු මත පැනනගින ගැටළු නිරාකරණය කිරීම සඳහා දේශීය වාණිජ බැංකු සහ ශ්‍රී ලංකා රේගුව වෙත උපදෙස් ලබා දීම මෙම ඒකකයේ කාර්යභාරය යටතට ගැනේ.

කලින් කලට රජයේ  ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සිදුකරනු ලබන විදේශ විනිමය ගනුදෙනු හා සම්බනධ වෙනස්කම් මෙහෙයුම් උපදෙස් ලෙස රාජ්‍ය හා වාණිජ බැංකු වෙත දැනුම්දීම මෙම ඒකකය මගින් සිදු කරනු ලබයි.